# කොම්පෝස්ට් හදන්නට බිම් පණුවන්ගේත් සහාය



එක්දහස් නවසිය හැටේ දශකයේදී දියුණු යැයි සම්මත රටවල ක්‍රියාත්මක වූ හරිත විප්ලවය නමැති පරිවර්තනය හරහා, බෝග නිෂ්පාදනයේ හදිසි පිබිදීමක් සමාජය විසින් දැකබලා ගන්නා ලදී. එහි ආස්වාදය දුප්පත්, පොහොසත් භේදයකින් තොරව සමස්ත ලෝකයටම නොදැනුණාද නොවේ. එසේ නමුත් ඊට හිලව් වන්නට පරිසරයේ ඇතැම් සංරචක වැනසී ගොස් ඇති බව මේ වනවිට බොහෝ දෙනකුට අවබෝධ වී හමාරය. විශේෂයෙන් බෝග වර්ධනයේ උපස්තරය ලෙස ක්‍රියා කරන පසෙහි සංයුතිය නොවූ විරූ අන්දමට වෙනස්වී තිබේ. රසායනික පොහොර අවිචාරවත් ලෙස භාවිත කිරීම සහ කාබනික ද්‍රව්‍ය නියම ප්‍රමාණය පසට නොදැමීම හේතුවෙන් බෝග වර්ධනය සඳහා තිබිය යුතු 5%ක පමණ වූ පාංශු කාබනික ද්‍රව්‍ය සංචිතය දස ගුණයකින් පමණ අඩුවී ඇති බව මෙරට පාංශු විද්‍යාඥයන්ගේ අදහසයි. එසේනම් දැන් ලහි ලහියේ කළ යුතු කර්තව්‍යයක් වන්නේ පසේ ප්‍රතිසංවිධානයයි. නොදිරූ ශාක අවශේෂ කාබනික ද්‍රව්‍ය වශයෙන් පසට එකතු කිරීමෙන් මෙන්ම කොම්පෝස්ට් වැනි අඩක් දිරාගිය පාංශු සත්කාරයක් පසට දැමීමෙන් වුවත් මෙය සිදුකළ හැකිය.

මුළුතැන්ගෙයින්, ගොවිපොළෙන්, වෙළෙඳපොළෙන් පරිසරයට මුදාහරින කාබනික කසළ, බිම් පණුවාගේ බඩවැල තුළින් යවා පෝෂණ ද්‍රව්‍යයෙන් පොහොසත් 'පණු පොහොර' නොහොත් 'පණු කොම්පෝස්ට්' නමැති ද්‍රව්‍යයක් නිපදවීමේ හැකියාවට යම් වටිනාකමක් ලැබෙන්නේ මෙවන් පසුබිමකය. සරලව ඇඹරෙමින් බඩවැල තුළින් යනවා පමණක් නොව ඒ තුළදී කසළ වලට ලොකු වෙනසක් සිදුවෙන බවද පෙනෙන්නට තිබේ. සත්‍ය යාන්ත්‍රණය හරියටම දන්නේ බිම් පණුවා පමණි. අනුභව කළ කසළ වලට බඩවැල තුළදී සිදුවෙන දෑ නිවැරදිව ඉදිරිපත් කරන්නට තවමත් දත්ත ගොනුකර ගෙන නැත. බිම් පණුවන්ගේ ආධාරය ඇතිව වාණිජ වශයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන ඉන්දියානුවන් ගැන විස්තර පවා අන්තර්ජාලයේ තිබේ. අප තවමත් එතරම් දුරට මෙම තාක්ෂණයට අනුගත වී නැත. ප්‍රතීක් බජාජ් නමැති ඉන්දියානුවාගේ Sehyogi Biotech වශයෙන් හැඳින්වෙන පණු කොම්පෝස්ට් නිෂ්පාදනාගාරයට තවමත් වසර පහකට වඩා වයස නැත. Ye Lo Khaad යන සන්නාම නාමය සහිතව අලෙවිවන ඔහුගේ 'පණු කොම්පෝස්ට්' නොහොත් 'පණු පොහොර' පළාතේ ගොවීන් දහස් ගණනකට පොහොර සහනාධාරයක් වෙනවා පමණක් නොව දේශයේ පවිත්‍රතාව රැකගැනීම වෙනුවෙන්ද අගනා මෙහෙවරක් ඉටුකරයි. ප්‍රතීක් වෙත වසරකට ලක්ෂ ගණනින් මුදල්ද උපයා දෙයි.

සාමාන්‍ය කොම්පෝස්ට් සාදන ක්‍රියාවලියට වඩා වේගවත්ව සිදුවෙන මෙම පණු පොහොර නිෂ්පාදනයේදී පණුවා තුළින් පිටවෙන ද්‍රව්‍යයන්ගේ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය වැඩිය. ශාක වර්ධක උත්තේජකද අන්තර්ගතය. පළිබෝධ විකර්ෂක ද්‍රව්‍යයන්ගෙන්ද පොහොසත්ය. ඇතැම් විස්තරවල පෙන්වාදී ඇති පරිදි කසළවලින් 'රත්තරන්' නිපදවීමේ ජෛව රස විද්‍යාවක් සේද මෙම ක්‍රියාවලිය හඳුන්වාදී තිබේ. මුළුතැන්ගෙයින් පිටවෙන අපද්‍රව්‍ය බිම් පණුවාට හොඳ ආහාරයකි.

## වගාබිම්වල කාබනික ද්‍රව්‍ය අන්තර්ගතය හොඳටම පහළ වැටිලා



ඔවුන්ගේ ආහාර මාර්ගය තුළදී මෙම ආහාර මනාව අඹරා, ජීර්ණය කර අවශ්‍ය දෑ සිරුරට උරාගන්නා අතර ඉතිරිය පණුවාගේ මල ද්‍රව්‍ය ලෙස පිටවේ. කොම්පෝස්ට් ලෙස යම් දිනකට පසුව අප හඳුනාගන්නේ මේවාය. පණුවන් නිසා පසට ව්‍යුහාත්මක ස්ථායීතාවක් ලබාදෙන අතර වාතනය, ජලය රඳාගැනීමේ හැකියාව ආදියද දියුණු වේ. 1994දී සිදුකර ඇති පර්යේෂණ වාර්තාවක සඳහන් වන්නේ සාමාන්‍ය කොම්පෝස්ට්වල අන්තර්ගත නයිට්‍රේට් නයිට්‍රජන් ප්‍රමාණය මෙන් හය ගුණයකින් වැඩි නයිට්‍රේට් සාන්ද්‍රණයක් පණු පොහොර තුළ අන්තර්ගත බවයි. මුළුතැන්ගෙය තුළින් බිහිවෙන කසළ හරහා පණු කොම්පෝස්ට් සෑදීම ඉතා පහසු ක්‍රියාවකි.

පණුවන් සහිත බඳුන ගෙය ඇතුළේ හිම වුවත් තබාගැනීමට පුළුවන. මෙම සතුන් ඉර එළිය හමුවට නොඑන බැවින් පණුවන් ඉන් පිටතට ඇවිත් අවට සැරිසරාවි යැයි සිතිය යුතු නැත. කෑම පිඟන්වල ඉතිරිවෙන දෑ, එළවළු පිසීමේදී ඉවත් කරන ද්‍රව්‍ය ආදී සියල්ලම පණුවන්ට කෑමට දැමිය හැකිය. මාළු කටු, කුළුබඩු යහමින් යොදා සෑදූ ව්‍යංජන ආදිය දැමීම සුදුසු නැත. බිත්තර කටු වැනි දෑ පවා එකතු කළ යුත්තේ හොඳින් කුඩු කිරීමෙනි. මස්, තෙල් සහිත ආහාර, දෙහි සුදුලූනු වැනි සැර ද්‍රව්‍ය වුවද සුදුසු නැත. පණුවන් ඒ හමුවේ මියයා හැකි බැවිනි. එළිමහනේ ඇති බඳුනක් නම්, ගොම, අතුගා එකතු කරන රොඩුබොඩු වුණත් පණුවන්ට ආහාර වන බැවින් ඒවාද සුදුසුය.

නිතර පණුවන් සොයා ගැනීමට නොහැකිනම්, අඟල් 3-4ක මතුපිට පස් තට්ටුවක් කසළ බඳුනේ පතුලට දමා එයට පණුවන් එකතු කර කටයුතු ආරම්භ කළ හැකිවේ. එම පස් තට්ටුව අවශ්‍ය වන්නේ පණුවන් බෝකිරීමටයි. කුස්සියේ ඉතිරිය දැන් දමන්නේ මේ පස් මතටයි. සිටිනා පණුවන් සංඛ්‍යාව හා එකතු කරන ද්‍රව්‍යයන්ගේ ස්වභාවය මත කොම්පෝස්ට් සෑදීමට ගතවන කාලය තීරණය වන අතර සියල්ල යහපත් නම් එය සති කිහිපයක් තුළ සිදුවේවි. පතුලේ ඇති පස් තට්ටුව කලඹන්නේ නැතිව මතුපිට නිපදවී ඇති කොම්පෝස්ට් ඉවත්කරගෙන අලුත් කසළ පිරවිය හැකිවේ. තරමක් විශාල වගාවක් සඳහා පණු පොහොර නිපදවන්නේ නම් එළිමහනේ යම් ස්ථානයක් මේ සඳහා යොදාගත හැකිය.

## පණු පොහොරවල නයිට්‍රජන් ප්‍රතිශතයත් වැඩියි

නිපදවී තිබෙන කොම්පෝස්ට් පණුවන්ගෙන් තොරව වෙන්කර ගැනීමට පහසුම ක්‍රමය වන්නේ සම්පූර්ණ මිශ්‍රණයම අඟල් කිහිපයක් ඝනකමට අව්වේ ඇතිරීමයි. එවිට පණුවන් සියල්ල පහළට යන නිසා ඉහළින් ඇති අඟල් දෙකක පමණ තීරුවක් කොම්පෝස්ට් ලෙස ඉවත් කර ගතහැකි වේ. මේ ක්‍රියාවලිය නැවත නැවතත් කළ හැකිය. එසේ නැත්නම් කොම්පෝස්ට් ගන්නා දිනට දින තුනකට පමණ පෙර මිශ්‍රණයට ජලය යෙදීම නතර කර, තරමක් වේළෙන්න හැර දැලකින් හලා පණුවන් රහිත කොම්පෝස්ට් වෙන්කර ගත හැකිය. දැන් පණුවන් නැවතත් බඳුනට දැමීමට පුළුවන. නමුත් දැලකින් හැලීම වැනි ක්‍රියාවකදී පණුවන්ට හානිවීමේ හැකියාවක් තිබෙන නිසා වඩාත් ප්‍රවේසම් විය යුතුවේ.

බිම් පණුවන් වෙසෙන ස්ථානය අනුව කොටස් තුනක් යටතේ ඔවුන්ව වර්ග කෙරේ. පණු පොහොර නිපදවීමට යොදාගත යුත්තේ පස මතුපිට වෙසෙනා රතු පැහැ පණුවන්ය. වීදුරු තහඩුවක් මත තැබූවිට ආලෝකය විනිවිද යන මොවුන්ගේ සිරුර තුළ දිවෙන කොළ පැහැ රේඛා දෙකක් මඟින් මොවුන් පහසුවෙන් හඳුනාගත හැකිවේ. මීට අමතරව පොළොවේ තරමක් ගැඹුරේ වෙසෙන ගැඩවිලුන් හෝ හොඳටම ගැඹුරේ සිටින අඩි කිහිපයක් දිග විශාල බිම් පණුවන් වැනි සතුන් පණු පොහොර නිෂ්පාදනයට යොදාගත නොහැකිය.






**සනත් එම්. බණ්ඩාර**

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය